# ව්‍යාපාර යෝජනා කැඳවීම

## තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

### කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය(SARP)

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල(IFAD) හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධ අරමුදල් සපයන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය(SARP) වියළි කලාපයන් හී කුඩා පරිමාණ ගොවීන් අතර දරිද්‍රතාව අවම කිරීමත්, ආහාර සුරක්ෂිතභාවය හා පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීමත් අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතිය මඟින් දේශගුණික බලපෑම් වලට ලක් වන කලාප වල කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වෙළඳ පොලට ප්‍රවේශ වීමට ඇති හැකියාව ඉහල දැමීම හා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර එහි මූලික භූගෝලීය ආවරණ කලාපය ලෙස දැදුරුඔය ඔය, මී ඔය සහ මල්වතු ඔය ගංගා ද්‍රෝණි වලට අයත් අනුරාධපුර, වවුනියාව, මන්නාරම, කුරුණෑගල, පුත්තලම හා මාතලේ දිස්ත්‍රික්ක තුල තෝරා ගත් ඉතා අවධානයට ලක් විය යුතු ප්‍රදේශ ඇතුළත් වේ.

තරුණ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන (Youth Entrepreneurship Development – YED) වැඩසටහන යටතේ තරුණ කෘෂි ව්‍යවසායකයින් හට වගා සංවර්ධනය (on-farm development), පසු-අස්වනු සැකසීම හා අගය එකතු කිරීම(post-harvest processing & Value addition) සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළ ව්‍යවසායකයින් ලෙස ආයෝජනය කිරීමට දිරි ගන්වයි. ඒ අනුව කුඩා පරිමාණ තරුණ කෘෂි ව්‍යවසායකයින් තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම හරහා ව්‍යාපෘතියට සම්බන්ධ විය හැකි අතර සුදුසුකම් ලත් තරුණ තරුණියන් වෙනුවෙන් තාක්ෂණික පුහුණුව, තුලිත ප්‍රදාන (උපරිම රු. 900,000ක් වන අතර එය ආයෝජන සැලසුමේ මුළු පිරිවැයෙන් 45%ට සමාන හෝ අඩු) සහ බැංකු සහ මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගැනීමට සහාය ලබා දීම ඇතුළුව පුළුල් ආධාර පැකේජයක් පිරිනමනු ලබයි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල වයස අවුරුදු 18-40 අතර, තරුණ තරුණියන් හට තම ව්‍යාපෘති යෝජනාව 2026 අගෝස්තු 14 දිනට හෝ පෙර (පළමු අවසන් කිරීම) ලියා පදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් පහත සඳහන් ලිපිනයේ ඇති පිහිටි SARP ව්‍යාපෘති කළමනාකරණ ඒකකය(PMU) ලැබීමට සලස්වන මෙන් ආරාධනා කරයි. සුදුසුකම් ලත් ව්‍යාපාර යෝජනා පුළුල් ඇගයීම් ක්‍රියාවලියක් හරහා තෝරා ගනු ලබන අතර පළමු ව පැමිණෙන අය සඳහා පළමු ව සේවා සැපයීමේ පදනම මත සලකා බලනු ලැබේ.

ව්‍යාපාර යෝජනා ආකෘතිය සහ ව්‍යාපෘති බල ප්‍රදේශය පිළිබඳ තොරතුරු www.sarp.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අතර වැඩි විස්තර 011- 2770986 යන දුරකථන අංකය ඔස්සේ තරුණ සංවර්ධන විශේෂඥ වෙතින් ලබා ගත හැක.


**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය,**

අංක. 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.

දුරකථන අංකය: 0112 770986

විද්‍යුත් ලිපිනය:**info@sarp.lk**